# සංක්ෂිප්තය

පාසලේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව කෙරේ හේතුවන සාධක රැසක් දැකිය හැකි අතර ඒ කෙරේ සෘජුව ම බලපෑම් කරනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ විදුහල්පතිවරයාගේ නායකත්වය යි. විදුහල්පති පාසලේ ප්‍රධාන පරිපාලකයා වශයෙන් සෑම කටයුත්තක් ම නිශ්චිත ක්‍රියාවලියක් මගින් පාලනය කරමින් හුදු දෛනික කටයුතුවලට පමණක් ම සීමා නොවී පුළුල් අධ්‍යාපනික පරමාර්ථ සහ අරමුණු ක්‍රියාවට නගමින් ඒවා සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කරණ පළමු පෙළේ කළමනාකරුවෙකි. එසේ ම පාසලේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඉහත කරුණු අතර මනා සුසංයෝගයක් ඇති කරන අන්දමේ සමස්ත ක්‍රියාවලියක් පාසල තුළ ක්‍රියාවට නගමින් තම නායකත්ව චර්යාව ක්‍රියාවට නගන සුසාධ්‍යකාරකයකු ලෙස කටයුතු කරනු ලැබේ.

මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වූයේ පාසලේ ඵලදායිතාව සඳහා ඉවහල් වන විදුහල්පති නායකත්ව චර්යාවේ ලක්ෂණ පිළිබඳ විමසා බැලීමයි. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් පාසලේ ඵලදායිතාව සඳහා ඉවහල්වන විදුහල්පති නායකත්ව චර්යාවේ ලක්ෂණ මොනවා ද යන්න විමර්ශනයට භාජනය කරණ ලදි. ඒ අනුව ප්‍රධාන අරමුණු පහක් යටතේ මෙම පර්යේෂණය සිදු කරණ ලදි. එනම් පාසලේ ඵලදායිතාව සඳහා හේතුවන විදුහල්පතිගේ නායකත්ව චර්යාවේ ගුනාංග විමසා බැලිම, විදුහල්පතිවරුන් අනුගමනය කරණ නායකත්ව ශෛලීන් විමසා බැලිම, විදුහල්පතිවරුන්ගේ උපදේශාත්මක කටයුතු විමසා බැලිම, විදුහල්පති වරුන්ගේ කළමනාකරණ කටයුතු විමසා බැලිම, එම ප්‍රධාන අරමුණු විය. එම ප්‍රධාන අරමුණු විය.

ඒ සඳහා සහේතුක නියැදිකරණය යටතේ පාසල් 12ක් තෝරාගැනිම කරණ ලදි. ඒ සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර අධ්‍යාපන කළාපයේ 1AB , 1C ,2 , වර්ගයේ පාසල් 12ක, විදුහල්පතීන් 12ක, ගුරුවරුන් 100 දෙනෙක්, නියැදිය ලෙස තෝරාගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සාහිත්‍ය විමර්ශණය, ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්චා, නිරීක්ෂණ ක්‍රය, ආදී ක්‍රම ශිල්ප භාවිතා කරන ලදි. මෙහි දි ප්‍රධාන පර්යේෂණ උපකරණය වුයේ ප්‍රශ්නාවලිය යි. එයින් ලබාගත් දත්ත ඉදිරිපත් කරමින් අර්ථකථනයේ දි විදුහල්පති සමඟ සම්මුඛ සාකච්ජා කිරීම, හා නරික්ෂණ තොරතුරු ද භාවිතා කරන ලදි. මෙම තොරතුරු ඉදිරිපත් කරමින් අර්ථකථනය කරමින් විශ්ලේශනයේ දි ප්‍රතිශත, වගු , රූප සටහන්, ද භාවිතා කරණ ලදි. එම දත්ත පාසල් වර්ගය හා ගුරු ප්‍රභේද යටතේ ද ඉදිපත් කරමින් එම කණ්ඩායම් දැක් වු සම අසමතා විශ්ලේෂණයට භාජනය කරන ලදි.

ප්‍රධාන පර්යේෂණ ගැටලු ඔස්සේ විමසීට භාජනය කළ කරුණු අතරින් පාසලේ ඵලදායීතාව සඳහා ඉවහල් වන විදුහල්පති නායකත්ව චර්යාවේ ලක්ෂණ ලෙස ආකර්ෂණීය පෞරුෂයකින් යුක්ත විම, සංනිවේදන කුසලතා වලින් යුක්තවීම, පැහැදිළි දර්ශනයක්, හා අරමුණු තිබිම, උපදේශනාත්මක නායකත්වය හා, මහපෙන්විම, අවස්ථාවෝචිතව තීරණ ගැනිම, පුද්ගල ශක්තීන් හඳුනාගැනීමේ හැකියාව,

වැනි නායකත්ව ලක්ෂණ අනාවරණය කරන ලදී. නායකත්ව ගුණාංග ලෙස දැඩි ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම, අන් අයගේ අදහස්වලට සවන් දී කටයුතු කිරීම. නායකයකු ලෙස කටයුතු කිරීමේ දී නිහතමානීව ක්‍රියා කිරීම, උපදේශනාත්මක මගපෙන්වීම ධනාත්මකව සෑම විටම කටයුතු කිරීම ආදී ගුණාංග ද පාසලේ ඵලදායීතාව සඳහා ඉවහල් වන විදුහල්පති නායකත්ව ශෛලීන් ලෙස ද පරිපාලන නායකයකුට වඩා උපදේශාත්මක නායකයකු මෙන්ම සහභාගිත්ව නායකත්ව ශෛලීන් අනුගමනය කරන බවත් අනාවරණය විය. විචල්‍ය යටතේ කරණ ලද විග්‍රහයේ දී නායකත්ව චර්යාව හැඩගැසීමට වයස බලපාන බවත් අවුරුදු 41- 50 ත් අතර වයසේ පසුවන විදුහල්පතිවරුන් වඩා කාර්යක්ෂම ලක්ෂණ පෙන්වූ බවත් අනාවරණය විය. ස්ත්‍රී පුරුෂභාවය අනුව පිරිමි විදුහල්පතිවරුන්ගේ, සේවා කාලය කාලය අනුව වයස අවුරුදු 10 ට වැඩි 50 ට අඩු විදුහල්පතිවරු වඩාත් කාර්යක්ෂම නායකත්ව ලක්ෂණ පෙන්වූ බව අනාවරණය විය.

මේ අනුව මෙම නිබන්දනයේ අන්තර්ගතය ප්‍රධාන පරිච්ඡේද පහතින් සමන්විත විය. ඒ අනුව පළමු පරිච්ඡේදය පර්යේෂණ ගැටලුව, ගැටලුවේ පසු බිම හඳුනා ගැනීම අධ්‍යයනය දියත් කිරීමේ සුවිශේෂී අරමුණ කවරේ ද යන්න කෙටියෙන් හඳුනා ගැනීමටත් මෙම අධ්‍යනයේ වැදගත්කම පිළිබඳවත් පළමුවන පරිච්ඡේදයෙන් සවිස්තරව විග්‍රහ කෙරේ.

දෙවන පරිච්ඡේදය වෙන් කරනු ලැබුයේ පර්යේෂණ ක්ෂෙත්‍රය පිළබඳ සාහිත්‍යය විමර්ශණය සඳහා වෙන් කරන ලදී. එහිදි පෙර අධ්‍යනයන් තුලින් මෙම ගැටලුව කෙරෙහි ලබා දී ඇති වැදගත්කම සොයා බැලීමටත් මෙම අධ්‍යනය දියත් කල යුතු දිසාව හඳුනා ගැනීමටත් අපේක්ෂා කෙරෙණි. මේ තුළින් දේශීය හා විදේශීය සාහිත්‍යය තොරතුරු ගණනාවක් මගින් පර්යේෂණයන්ට ආලෝකයක් ලබා ගැනීමට හැකි විය. මෙම පරිච්ඡේදය තුළදී ඵලදායි පාසල හා එහි ලක්ෂණ පිළිබඳව පෙර සාහිත්‍යය කෙරෙහිද විදුහල්පති නායකත්ව චර්යාව නායකත්ව ලක්ෂණ විදුහල්පති භූමිකාවේ ස්වරූපය ආදිය පිළිබඳ අවධානය යොමුකොට ඇත.

තුන්වන පරිච්ඡේදය තුලින් පර්යේෂණයේ ක්‍රමවේදය පිළිබඳ දීර්ග විස්තරයක් දක්වා ඇත. ඒ තුළ අධ්‍යන ක්‍රම ශිල්පය තෝරාගත් ආකාරය නියැදිය තෝරා ගැනීම පර්යේෂණ උපකරණ සකස් කිරීම. නියාමන පරීක්ෂණ දත්ත විශ්ලේෂණ ක්‍රමශිල්පයන් මෙන්ම පර්යේෂණය දියත් කිරීමේදී ඇති කරගත් සීමා පිළිබඳවත් සඳහා මෙම පරිච්ඡේදය වෙන් කරන ලදී

පර්යේෂණයේ හතරවන පරිච්ඡේදය දත්ත ඉදිරිපත් කිරීම. සහ අර්ථකථනය සඳහා වෙන් කරන ලදී. ඒ සඳහා ප්‍රශ්නාවලිය සම්මුඛ සාකච්ඡා නිරීක්ෂණ තුලින් ගුරුවරුන්ගෙන් විදුහල්පතිවරුන්ගෙන් රැස්කර ගන්නා ලද දත්ත ඒ ඒ අරමුණ අනුව විග්‍රහ කිරීම සඳහා මෙම පරිච්ඡේදය වෙන් කරන ලදී.

පස්වන පරිච්ඡේදය පර්යේෂණයෙන් ඵළඹෙන ලද නිගමන හා යෝජනා සඳහා වෙන් කර ඇත. පර්යේෂණ අරමුණු කර ගනිමින්ද පර්යේෂණ අනාවරණ සියල්ල සලකා බැලීමෙන් පසු පර්යේෂණ නිගමන ඉදිරිපත් කර ඇති අතර අනාගත පර්යේෂණ සඳහා සඳහා යෝජනා ද ඉදිරිපත් කරන ලදී.